# ශ්‍රී ලංකාවේ පාසල්වල පාසල් අධිලේඛනාගාර පිහිටුවීම හා ඒ ආශ්‍රිත ක්‍රියාකාරකම් හඳුනාගැනීම

**කේ.ආර්.එන්. හර්ෂණී**
ප්‍රධාන පුස්තකාලය, ව්‍යවහාරික විද්‍යා පීඨය,
ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලය.
wimukasi@yahoo.com

ප්‍රමුඛ පද : අධිලේඛනාගාර, පාසැල් ලේඛනාරක්‍ෂක දෙපාර්තමේන්තුව, කෞතුක භාණ්ඩ

## හැඳින්වීම

යහපත් පුරවැසියකු බිහිකිරීම මූලික අරමුණ කොට ගත් පාසල් අධ්‍යාපනය සඳහා අධ්‍යාපන කාර්යයයේ දී හිමි වනුයේ අද්විතීය ස්ථානයකි. 1998 වර්ෂයේදී ශ්‍රී ලංකාවට හඳුන්වා දුන් නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණයත් සමඟින් ගුරු කේන්ද්‍රීය අධ්‍යාපනය ක්‍රමයෙන් ශිෂ්‍යය කේන්ද්‍රීය අධ්‍යාපනය බවට පත් විය. තොරතුරු හා දැනුම උත්පාදනය වීමෙන් සීඝ්‍රත්වය සමඟ කිසිදු විෂයක් සම්බන්ධ සියලු ම තොරතුරු පන්ති කාමරය තුළ දී ඉගැන්විය නොහැකි ය. එහි දී වැදගත් වන්නේ අවශ්‍ය තොරතුරු සහ දැනුම සොයා ඉගැන්වීමයි. අනාගත පරපුරට අවශ්‍ය දැනුම දායාද කිරීමේ දී පාසල් පුස්තකාල මෙන්ම පාසල් අධිලේඛනාගාර ද තොරතුරු සම්පත් එකතු කරමින් සේවා සපයන ස්ථානය ලෙස හැඳින්විය හැක. පාසල් අධිලේඛනාගාර සංකල්පය සමාජයට අවශ්‍ය වැඩදායී සාර්ථක පුරවැසියකු බවට පත්කිරීමේ අරමුණින් පිහිටුවන ලදී. ශිෂ්‍යායාට දැනුම්, කුසලතා, ආකල්ප, හර පද්ධතියන් පැවරීම පාසලේ ප්‍රධාන කාර්යයභාරයන් අතර මූලික තැනක් ගනු ලබයි. පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක භාවය වර්ධනය කිරීම සඳහා පාසල් අධිලේඛනාගාර මගින් ලැබෙන පිටිවහල අපමණ ය. මෙම පාසල් අධිලේඛනාගාර පිහිටු වීමේ උදාර කාර්යයභාරය හා එහි මූලික ප්‍රයත්නයන් දරමින් කටයුතු කරනු ලබන්නේ ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව වේ. මේ වනවිට ශ්‍රී ලංකාවේ ස්ථාපිත කරඇති පාසල් අධිලේඛනාගාර සංඛ්‍යාව තිස්නවයක ප්‍රමාණයක් වේ. ඒ අතර සක්‍රීයව පවත්වාගෙන යන පාසල් අධිලේඛනාගාර මෙන් මේ වන විට අක්‍රිය පාසල් අධිලේඛනාගාර ද ඇත. ශ්‍රීලංකාවේ පාසල්අධිලේඛනාගාර පිහිටුවීමේ මූලික අරමුණු අතර පාසල් සම්බන්ධ ව තොරතුරු ලබා ගැනීමේ දී අවශ්‍ය තොරතුරු සමුද්දරණය කර්යක්ෂම ව කරගැනීමටත් එම තොරතුරු ක්‍රමවත්ව ගබඩාකොට තබා ගනිමින් අනාගත පරම්පරාව වෙනුවෙන් සංරක්ෂණය කිරිමත්

හඳුන්වා දිය හැක. පාසල පිහිටා ඇති ප්‍රදේශයට අයත් තොරතුරු සංස්කෘතික වටිනාකම් ඇතුළත් භාණ්ඩ පුරාවිද්‍යාත්මක සාධක ඇත්නම් ඊට අදාල තොරතුරු එක්රැස් කිරීම හා ගබඩා කිරීම ද මෙහිලා වැදගත් ය. පාසලේ අනුස්මරණ සංස්කෘතියන් බිහිකිරීම මෙම පාසල් අධිලේඛනාගාර ස්ථාපිත කිරීමෙන් සිදු වේ. මුල් කාලීන ව පාසල් පිහිටුවීම ඊට දායක වූ පුද්ගලයින්, පාසල් ගොඩනැගිලි, ගුරුමණ්ඩලය, විදුහල්පතිවරු, විවිධ සංගම් ආදී බොහෝ තොරතුරු මූලාශ්‍ර මෙහිලා ඇතුළු කළ හැක. මෙමගින් සෑම අවස්ථාවක ම පාසලේ ප්‍රෞඩත්වය ප්‍රදර්ශනය කිරීමක් ද සිදු වේ. පුස්තකාලයෙන් දක්නට ලැබෙනුයේ පොත්පත්, වාර සඟරා, විද්‍යුත් මූලාශ්‍ර වැනි මූලාශ්‍රයන් ය. පාසල් අධිලේඛනාගාර පිහිටුවීමේ දී ඒ සඳහා අඩිතාලම දමමින් ඒ සඳහා කටයුතු කළ මූලික ආයතනය වන්නේ ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවයි. පාසල පිළිබඳ ක්‍රමවත් තොරතුරු එක්රැස් කරමින් සංවිධානය කරමින් අවශ්‍ය වන විට තොරතුරු ලබා දීම මෙමගින් සිදු වේ. පාසල් අධිලේඛනාගාර සඳහා පාසල පිහිටුවීම සඳහා මූලික වූ පුද්ගලයින් ගුරුවරුන්, විදුහල්පතිවරුන් ඒ අශ්‍රිත විවිධ සංගම් පිළිබඳ තොරතුරු එක්රැස් කරමින් වර්තාගතකර තැබීමක් සිදු වේ. පාසල් අධිලේඛනාගාරයන් සඳහා මුල් කාලීන ව පාසල අශ්‍රිත ව ඇති ලාංඡන, නිලඇඳුම්, ටයිපටි ආදිය ද තොරතුරු සම්පතක් වේ. පාසල විසින් බිහිකරනු ලබන ලිපිගොනු ක්‍රමානුකූල ව වාර්තාගත කර තබන අතර අනාගත අවශ්‍යතාවන් සඳහා ආරක්ෂා කරමින් තබාගැනීම පරමාර්ථයන් ද වේ. ඩයස් 1988 සඳහන් කරන පරිදි පාසල පිහිටා ඇති ප්‍රදේශය, ඉතිහාසය සුරැකීම, පාසල පිහිටා ඇති පරිසරය පිළිබඳ ව නැතිනම් එම දිස්ත්‍රික්කය, ගම හා පිහිටි භූමිභාගය පිළිබඳ විස්තර සෙවීම හා ඒවා පාසල් අධිලේඛනාගාරයක් ස්ථාපනය කිරීමේ දී හා පවත්වාගෙන යාමේ දී ඊට ම වෙන් වූ ඉඩ ප්‍රමාණයන් හා විශේෂ තොරතුරු සම්පත් තැන්පත් කිරීම හා ප්‍රදර්ශන සඳහා භාණ්ඩ අවශ්‍ය ය. අධිලේඛනාගාරය තුළ පාසල පිහිටුවා ඇති ප්‍රදේශයේ ඇති විශේෂ සංස්කෘතික වටිනාකම් ඇති කෞතුක භාණ්ඩ, ලිඛිත මූලාශ්‍ර, ජනජීවිතය හා බැඳුණු තොරතුරු, භූ විෂමතා ලක්ෂණ ඇතුළත් තොරතුරු තැන්පත් කර තැබීමත් දැකිය හැකි ය. මෙහි දී පාසලේ ඉගැන්වීමේ කාර්යයයේ දී අධිලේඛනාගාර සම්පත් භාවිත කිරීමට විශේෂ අවස්ථාවන් හිමිවන අතර සිසුදරුවන්ට ඒවා සියැසින් ම දැකබලා ගැනීමට හැකියාව ද අත්පත්වනු ඇත. ඉගෙනුම් ඉගැන්වීමේ කාර්යයේ දී ගුරුවරුන්ට මෙය තවත් ඉගෙනුම් පරිසරයක් ලෙස භාවිත කිරීමට හැක. අත්පත් කරගත් තොරතුරු සම්පත් අනාගත පරපුරට දායාද කිරීම සඳහා සංරක්ෂණ කිරීම මෙහිලා මූලින් ම භාරදූර කාර්යය ලෙස දැක්විය හැක. මෙමඟින් පාසල් දරුවන්ට විවිධ මාධ්‍යයේ මෙන් ම ස්වරූපයේ තොරතුරු හඳුනාගැනීමටත් ඒ සඳහා ප්‍රවේශ වීමටත් හැකියාව ලැබීම ද

මෙහි ඇති විශේෂත්වයකි. උදහරණයක් ලෙස විවිධ පුද්ගලයින්ගේ පුද්ගලික එකතුන්, පරම්පරාවල ඉතිහාසය ආදිය දැක්විය හැක. එක අතකින් ප්‍රදර්ශන මධ්‍යස්ථානයන් ලෙස ද දැක්විය හැක. විදුහල්පති හා ගුරු මණ්ඩලයේ ක්‍රියාකාරිත්වය මත මෙය සංවර්ධනය කර ගැනිමටත් විවිධ අයුරින් උදව්උපකාර ලබාගැනිමට උත්සුක වීමතුළින් වඩා යහපත් සේවාවක් පවත්වා ගෙන යාමට අවස්ථාව උදාවෙනු ඇත.

## ක්‍රමවේදය

ප්‍රධානක්‍රමවේදය ලෙස මූලාශ්‍ර ගවේශනය සිදුකරන ලදී. මෙම පර්යේෂණය ඉදිරියටත් සිදුකරමින් යන අතර එහි දී පාසල් අධිලේඛනාගාර පවත්වාගෙන යන පාසල් පිළිබඳ නිරීක්ෂණයන් මගින් දත්ත වාර්තා කිරීමට නියමිතය.

## ප්‍රතිඵලය හා සාකච්ඡාව

පාසල් අධිලේඛනාගාරයන් පවත්වාගෙන යාමේ දී ඉන් පාසලට ප්‍රයෝජන ගණනාවක් ලැබෙන අතර මෙය නඩත්තු කිරීම හා පවත්වාගෙන යාමේ දී ගුරුවරු, දෙමාපියන්, ශිෂ්‍යයින් මෙන් ම ගම්වාසින් වෙනත් ප්‍රභූවරුන්ගේ දායකත්වය ලැබිම තුළින් එය ක්‍රමාණුකූල ව පවත්වාගෙන යාමට පහසු වනු ඇත. ආදිශිෂ්‍ය සංගම් මගින් ලබා ගත හැකි දායකත්වය විශාල ය. ආදිශිෂ්‍ය ලෙස ඔවුනට ද ඉතිහාස ගත තොරතුරු සැපයිමට මෙන් ම මෙය ඉදිරියට ඵලදායි හා කාර්යක්ෂම පවත්වා ගෙන යාමට කටයුතු කිරීමට හැකියාව ඇත. අපේ රටේ පාසල් ලේඛනාරක්ෂක යන තනතුරක් නොමැති වීම නිසා මෙහි භාරකාරත්වය ගුරුභවතෙකුට දිය යුතු වේ. අවශ්‍ය මූලික දැනුම ගැනීම සඳහා ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව මඟින් පවත්වනු ලබන පුහුණු පාඨමාලා මගින් පුහුණුවක් ලබා ගැනීමට අවස්ථා ලබාදිය හැක. විශාල වටිනාකමකින් යුතු පාසල් අධිලේඛනාගාරයක් යනු සෑම පාසලක ම තිබිය යුතු අත්‍යවශ්‍ය තොරතුරු මධ්‍යස්ථානයක් ලෙස හැඳින්විය හැක. ලෝකයේ පාසල් පුස්තකාල විමර්ශනය කිරීමේ දී පෙනී යන කරුණක් වනුයේ පාසලක පාසල් අධිලේඛනාගාර සඳහා ඉහළ ස්ථානයකින් යුතු කටයුතු කරන බවත් ඒ සඳහා ඊට විශේෂ පුහුණුවක් හා අධ්‍යාපනයන් ලැබූ ලේඛනාරක්ෂක තනතුරක් ද ඇති බවකි. වත්මන් අධ්‍යාපනයේ ඉලක්ක සපුරා ගැනීමේ ක්‍රියාවලිය සඳහා පාසල් අධිලේඛනාගාර සෑම පාසලක් සඳහා ම ස්ථාපිත කිරීම අවශ්‍ය කාරණයක් ලෙස හැඳින්විය හැක.

## විමර්ශන මූලාශ්‍ර


විමලරත්න, කේ.ඩී.ජී. (2002) *ලේඛණ හා අධිලේඛන කළමනාකරණ මූලධර්ම*, ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව, කොළඹ.

විමලරත්න, කේ.ඩී.ජී. (1980) ශ්‍රී ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය, කොළඹ.

ඩයස්, අජන්තා (1988) ජාතික ලේඛනාරක්ෂක දෙපර්තමේන්තුව, කොළඹ.